# පරිහානියට පත්ව ඇති බෞද්ධ උරුමය : පාතහේවාහැට ධර්මශාලා පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ටී. එච්. ජී. ඒ. කේ. ජයසූරිය[1]

## හැඳින්වීම

කන්ද උඩරට රාජධානිය හෙවත් කන්ද-උඩ පස් රට ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අවසාන රාජධානිය යි. ප්‍රාදේශීය පරිපාලන රටාවක් යටතේ පැවති රාජධානියේ සීමාවන්ට අදාළ ප්‍රදේශය දිසා 12ක් රටවල් 5ක් (පසුව මෙය රටවල් 9ක් දක්වා වැඩි වී ඇත) වන ලෙස බෙදා තිබූ බව දැක්වේ. දුම්බර, හාරිස්පත්තුව, උඩුනුවර, යටිනුවර, හේවාහැට යන රටවල් කන්දඋඩ පස්රටට අයත් විය. හේවාහැට මා ඔය පදනම් කරගනිමින් එගොඩතිහ (පාතහේවාහැට) හා මෙගොඩතිහ (උඩහේවාහැට) ලෙසින් පරිපාලන ඒකක දෙකකට බෙදූ බව පැහැදිලි වේ. එගොඩතිහ හෙවත් පාතහේවාහැට පර්යේෂණ කලාපය කරගනිමින් එහි ඓතිහාසිකත්වය, භූගෝලීය හා භූ විද්‍යාත්මක පසුබිම හා කලාපයේ පවතින පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික, වාස්තු විද්‍යාත්මක, දේශපාලනික හා කලාත්මක වැදගත්කමකින් යුක්තවන ධර්මශාලා පිළිබඳව ප්‍රදේශය ආශ්‍රිත ස්මාරක, ජනකවි, ජනකතා හා ලේඛනගතමය මූලාශ්‍ර, සෙල්ලිපි ආදිය පාදක කරගනිමින් පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික අධ්‍යයනයක් කර එම ස්මාරක ලිඛිත හා දෘශ්‍යමය මාධ්‍යයෙන් වාර්තාගතකරමින් ඉදිරිපත් කිරීම හා එහි වත්මන් තත්ත්වය හඳුනා ගැනීම මෙහි මූලික අරමුණ විය.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී දත්ත රැස් කිරීමට, වාර්තාගතකිරීමට, විශ්ලේෂණයට හා ඉදිරිපත් කිරීමට මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා ආදි අධ්‍යයන ක්‍රමවේද භාවිත කරමින් ධර්මශාලා හා එහි ඓතිහාසිකත්වය, උපයෝගීතාව, වාස්තුවිද්‍යාව ආදි කරුණු හඳුනා ගැනීම කරන ලදි.

## අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව

පාතහේවාහැට පුරාවිද්‍යාත්මක උරුමය නිර්මිත මාධ්‍යය, කාලය, සමාජ උපයෝගීතාව, වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව යම් විවිධත්වයක් යටතේ පවතින

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය
Anushajayasooriya1@gmail.com

බව පැහැදිලි ය. ඒවායේ උපයෝගීතාව අනුව බහුතරයක් උරුමයන් බෞද්ධාගමික උරුමයන් බව හඳුනාගත හැකි වූ අතර සමස්ත පර්යේෂණ කලාපයේ කළ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ධර්මශාලා 10ක් හඳුනාගත හැකි විය. ගොඩමුන්න, බෝපිටිය, මාරස්සන, හිප්පොල, අග්‍රබෝධි... ආදි ධර්මශාලා එහි දී ප්‍රධාන විය. ධර්මශාලා බණ මඩු, බණ ගෙවල් ලෙසින් ද හැඳින් වේ. "බණ මඩුව වූ කලී කණු උඩ නැංවූ එළිමහන් ගොඩනැගිලි ය. ඇතැම්විට තාවකාලික මඩු ය. පෝය දිනවලදී බණපොත් කියවන විට සවන්දීම පිණිස විශාල ජනකායක් මෙහි රැස් වේ. බණ පොත කියවන්නේ සුදු රෙදිවලින් ආවරණය කළ උස් අසුනක හෝ කුඩුව වැන්නක (ධර්මාසනයක) අසුන්ගත් භික්ෂූන් වහන්සේ විසිනි. සිරිත් වශයෙන් ම බණ මඩුව පිහිටියේ විහාරයෙන් වෙන්ව ය" (කුමාරස්වාමි ආනන්ද කේ, 1994 : පි.119).

පාතහේවාහැට ධර්මශාලා හෙවත් බණමඩු තුළින් කලාපයේ ආගමික තත්ත්වය නිරූපණය වේ. එහි දී එක් එක් ධර්මශාලා හා බැඳි විවිධ ආගමික සංසිද්ධීන් සුවිශේෂී වේ. ධර්මශාලා නිර්මාණයේ දී කලාපයේ භූ දර්ශනය අනුව උස් ස්ථානයක කලාපයේ රජමහ විහාර හා අනෙකුත් ආගමික මධ්‍යස්ථානයන්ගෙන් පහසුවෙන් වෙන් කර හඳුනාගත හැකි අයුරින් එක හා සමාන වාස්තු විද්‍යාත්මක සැළසුමක් හා ආකෘතියක් අනුව ඉදි කර ඇති බව පැහැදිලි වේ. එනම් ධර්මශාලාවල වහළය මහල් 3ක් වන පරිදි හා ශාලාව අභ්‍යන්තරය මට්ටම් (වේදිකා) 3ක් වන පරිදි සතර දිශාවෙන් දොරටු 4ක් යොදා මහල් ගොඩනැගිල්ලක ස්වරූපය විදහා දැක්වෙන පරිදි නිර්මාණය කර ඇත. ශාලාව අභ්‍යන්තරයේ ඕලන්ද වාස්තුවිද්‍යාවේ කවාකාර පෙදරේරු කුලුණු යොදා ගෙන ඇත. ඇතැම් ධර්මශාලාවල බිත්තියෙහි හා සිවිලිමෙහි සිතුවම් නිර්මාණය කර ඇත. ඒ අනුව මේ සඳහා ඕලන්ද ගෘහ නිර්මාණ සම්ප්‍රදායේ ආභාසය ලැබෙන්නට ඇති බව ද පැහැදිලි වේ.

ධර්මශාලා ඉදි කිරීමේ ආරම්භක අවධිය අනුරාධපුර අවධිය ලෙස පිළිගත හැකි වුව ද මහනුවර අවධියේ සරණංකර සංඝරාජ හිමියන්ගේ අනුසාසනාව මත කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික සේවාව යටතේ විශේෂ වාස්තුවිද්‍යාත්මක ආකෘතියක් යටතේ හේවාහැට ධර්මශාලා නිර්මාණය කර ඇති අතර හේවාහැට ගොඩමුන්න ධර්මශාලාව ඉන් පළමුවැන්න ලෙස පිළිගනු ලැබේ. මෙමගින් අම්බලමක කාර්යයට සමාන කාර්යයක් ඉටු වන්නට ඇති බව ඒවා ඉදි කර ඇති භූමිය, උපයෝගීතාව හා ස්වරූපය අනුව පැහැදිලි වේ. ප්‍රධාන වශයෙන් ගැමියන්ට බණ ඇසීමට, සිල් සමාදන් වීමට, ධර්මය සාකච්ඡා කිරීමට, ගමේ පන්සලේ පෙරහැර සූදානම් කිරීම හා ඒ සඳහා සහභාගිවන පිරිසට නැවතීමට හා ආගමික වන්දනාකරුවන්ට ගිමන් හැරීමට ආදී කාර්යයන්වලට යොදා ගන්නට ඇති අතර

හැම විටම ගමේ පන්සලෙන් හා අම්බලමෙන් පරිබාහිරව වෙල් යායක් මධ්‍යයේ හෝ ආසන්නව, ජල මූලාශ්‍රයක් අසළ උස් භූමියක නිර්මාණය කර ඇති බව දැකගත හැකි ය. ධර්මශාලා විටක රැස්වීම් ශාලාවක් හා සභා ශාලාවක් ලෙසින් ද පවතින්නට ඇති බව පැහැදිලි වේ.

ඉහත දැක් වූ වාස්තුවිද්‍යාත්මක ආකෘතිය යටතේ නිර්මාණය කර ඇති ධර්මශාලා තුළින් සමකාලීන සමාජ ක්‍රමයේ පැවති කුල ක්‍රමය නිරූපණය වන බව පැහැදිලි වේ. එනම් එහි ඉහළ වේදිකාව හෙවත් උඩ මණ්ඩප්පය භික්ෂූන්ට දහම් දෙසීමට ද දෙවන වේදිකාව උසස් කුලයේ ප්‍රභූන්ට බණ ඇසීමට ද පහළම වේදිකාව කුල හීන ජනතාවට දහම් ඇසීමට ද භාවිත කළ බව ප්‍රදේශයේ පැරැන්නන්ගෙන් කළ විමසුම්වලින් පැහැදිලි විය. මේ වන විට වසර සියයකට වඩා පැරණි සහ ආසන්නවන පාතහේවාහැට ධර්මශාලා වර්තමානය වන විට විනාශයට පත් වෙමින් හුදෙකලාව පවතින ස්මාරක විශේෂයක් පමණක් ලෙසට පත් ව ඇති අතර ඒ අතරින් කිහිපයක් පමණක් විවිධ රජමහ විහාර සමග ඒකරාශි වෙමින් විවිධ ආගමික හා ආගමික නොවන කාර්යයන් හි උපයෝගී කරගන්නට ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මකව වැදගත් උරුමයක් බව පැහැදිලි වේ.

## නිගමනය

විධිමත් භූගෝලීය බෙදීමකට වඩා ඓතිහාසික පරිපාලනමය බෙදීමත් යටතේ කඳුකර හා මඩ බෑවුම් භූ දර්ශනයකින් යුත් ස්වාභාවික ජල මූලාශ්‍ර, පාෂාණ හා ඛනිජ ව්‍යාප්තියක් පවතින තෙත් හා වියළි දේශගුණික ලක්ෂණවලින් සමන්විත ආරක්ෂිත භූමි ප්‍රදේශයක් වන පාතහේවාහැට ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක උරුමයන් ඒවායේ සමාජ උපයෝගීතාව, කාර්යය, ආකෘතිය, නිර්මිත කාලය, මාධ්‍යය අනුව විවිධතාවයක් නිරූපණය කරන බව නිගමනය කළ හැකි ය. කලාපීය පුරාවිද්‍යාත්මක උරුමයන් අතරින් විශේෂ බෞද්ධාගමික උරුම පද්ධතියක් වන ධර්මශාලා නිශ්චිතවම කාලනීර්ණය කිරීමට අසීරු වුව ද ඒවායේ වාස්තුවිද්‍යාත්මක සැළසුම්, ආකෘති, පැරණි සමාජ උපයෝගීතාව අනුව සාපේක්ෂ වශයෙන් බහුතරයක් මහනුවර සමයට අයත්වන බව කාලනීර්ණය කළ හැකිවිය. ධර්මශාලා සමකාලීන සමාජයේ පැවති සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික, කලාත්මක, සංස්කෘතික විවිධත්වයට අනුගතව නිර්මාණය කර ඇති නිසාවෙන් කලාපීය පුරාවිද්‍යාත්මක උරුමය සමකාලීන සමාජ ක්‍රමය අධ්‍යයනය කිරීමේ දී පාදක කරගත හැකි වැදගත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය විශේෂයක් ලෙසින් ද නිගමනය කළ හැකි ය.

ධර්මශාලා 10ක පමණ ප්‍රමාණයක් හා රජමහ විහාර 06ක් පමණ ද කලාපය පුරාවට හඳුනා ගැනීමට හැකි වීමෙන් ද එකල මෙම ප්‍රදේශයේ බෞද්ධාගම හොඳින් ප්‍රචලිතව පැවති සාරධර්මවලින් පිරිපුන් ප්‍රදේශයක්ව පවතින්නට ඇති බව නිගමනය කළ හැකි අතර ආගමික, අධ්‍යාපනික, සංස්කෘතික, සන්නිවේදන ආදි අම්බලමක උපයෝගීතාවන්ට සමාන උපයෝගීතාවන්ගෙන් සමන්විතව පවතින්නට ඇති මෙම ධර්මශාලා පාතහේවාහැට කලාපයට ආවේණික එහි බෞද්ධාගමික තත්ත්වය හා සමකාලීක සමාජ තත්ත්වය නිරූපණය කරන වාස්තුවිද්‍යාත්මක නිරූපණයක් ලෙසත් වර්තමානය වන විට ධර්මය දේශනා කිරීම හා ශ්‍රවණය කිරීමේ ක්‍රියාවලිය පිරිහීම, වත්මන් සමාජ ආර්ථික රටාව, කාර්යබහුලත්වය, නව පහසුකම් සපිරි මහමෙව්නාව වැනි ආගමික මධ්‍යස්ථානයන් බිහිවීම, පන්සල් ආශ්‍රිතව නව ධර්මශාලා බිහිවීම හා මිනිසාගේ නොදැනුවත්කම හා අනවබෝධය ආදි කරුණු නිසාවෙන් පරිහානියට පත් ව ඇති ආගමික, වාස්තුවිද්‍යාත්මක, ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අගයන්ගෙන් සමන්විත බෞද්ධ උරුම පද්ධතියක් ලෙසින් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : පාතහේවාහැට ධර්මශාලා, ධර්මශාලා වාස්තුවිද්‍යාව, උපයෝගීතාව, වත්මන් තත්ත්වය

ආශ්‍රිත ග්‍රන්ථ

අලුත්වත්ත, ප්‍රගීත් මධුරංග. (2005). *ශ්‍රී ලාංකේය ලන්දේසී ගෘහ නිර්මාණ සම්ප්‍රදාය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

කුමාරස්වාමි ඒ. කේ. (1962). *මධ්‍යකාලීන සිංහල කලා*, කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,

තෙන්නකෝන්, විමලානන්ද. (1962). *උඩරට කැරැල්ල*, ☞☞ කාණ්ඩය. කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

දසනායක, රෝහිත. (2000). *අම්බලම සහ සමාජය.* වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

දිසානායක, සෙනරත් බණ්ඩාර. (1997). *දියතිලක නුවර පැරණි ස්මාරක ස්ථාන*, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

Lawrie A.C. (1886). *A Gazetteer of the central province of Ceylon* , Vol☞ and Vol ☞☞. Colombo.